# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත

---

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත

[සහතිකය සටහන් කළේ 1990 මාර්තු මස 6 වන දින]

එල්. ඩී.—ඕ. 6/89

**නිශ්චිත නියමයන්ට අනුකූලව දේශීය භාර ලදුපත් ලියා අත්සන් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (1) ශ්‍රී ලංකාවේ දේශය ඇතුළත ප්‍රවාහනය කිරීමේ සහ විකිණීමේ කාර්ය සඳහා භාණ්ඩ මිල දී ගැනීමට තමා අදහස් කරන බවට යම් තැනැත්තකු විසින් යම් අනුමත ණය නියෝජිත ආයතනයක් වෙත කරනු ලබන ප්‍රකාශයක් මත, එම භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ කාර්ය සඳහා සහ එම භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ විකිණීම සම්බන්ධයෙන් ද, එම භාණ්ඩ ප්‍රවාහනය කිරීම සහ විකිණීම සඳහා සූදානම් කිරීම සම්බන්ධයෙන් ද සිදුවන වියදම පියවීමේ කාර්ය සඳහා (මෙහි මින්මතු ' දේශීය භාර ලදුපතක් ' යනුවෙන් සඳහන් කරනු ලබන) (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වූ ලේඛනයක් එම නියෝජිත ආයතනයේ නමට ලියා අත්සන් කිරීමෙන් එම තැනැත්තා විසින් එම නියෝජිත ආයතනයෙන් ණයක් අයිරාවක් වශයෙන් හෝ අන්‍යාකාරයකින් අත්තිකාරම් මුදලක් ලබා ගන්නා අවස්ථාවක දී, එම භාර ලදුපත සම්බන්ධයෙන් ද එය අදාළ වන භාණ්ඩ සම්බන්ධයෙන් ද 3 වන වගන්තියේ විධිවිධාන අදාළ කරගත හැකි විය යුතු ය. **ශ්‍රී ලංකාවේ දේශය ඇතුළත ප්‍රවාහනය කිරීම සහ විකිණීම සඳහා භාණ්ඩ සඳහා භාර ලදුපත්.**

(2) මෙම උපවගන්තියේ විධිවිධානවලට එකඟව ක්‍රියා කිරීම සඳහා, (1) වන උපවගන්තියේ සඳහන් අවස්ථානුගත කරුණුවල දී යම් තැනැත්තකු විසින් ලියා අත්සන් කරනු ලබන ලේඛනයක, එම ලේඛනය අදාළවන භාණ්ඩ සම්බන්ධයෙන් එම තැනැත්තා එකඟවන පහත දැක්වෙන පොරොන්දු අන්තර්ගත විය යුතු ය :—

(අ) එම ලේඛනය ලියා අත්සන් කරනු ලබන්නේ යම් නියෝජිත ආයතනයක නමට ද එම නියෝජිත ආයතනය සඳහා භාණ්ඩ භාරයේ තබා ගැනීම සඳහා ද භාණ්ඩ හෝ ඒවා අන්තර්ගත පෙට්ටි හෝ ආවරණ යම් නිශ්චිත ආකාරයකට ලකුණු කිරීම සඳහා ද එම භාණ්ඩ ප්‍රවාහනය හා විකිණීම කරන තුරු ඒවා, නිශ්චිත පරිශ්‍රයක තබා ගැනීම සඳහා ද වන පොරොන්දුවක් ;

2—ඩී 007504—6,200 (89/12)

(ආ) එම භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල් හෝ එම මුදලින් යම් නිශ්චිත ප්‍රමාණයක් භාරයේ තබා ගැනීම සඳහා සහ එම මුදල් ලැබෙන ආකාරයට වරින්වර නියෝජිත ආයතනය වෙත ගෙවීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඇ) රක්ෂණය කළහැකි සියලුම අවදානම්වලට එරෙහිව භාණ්ඩ රක්ෂණය කළහැකි සම්පූර්ණ වටිනාකමට ම සහ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පදනමක් මත නියෝජිත ආයතනයේ නමට භාණ්ඩ රක්ෂණය කිරීම සඳහා ද භාණ්ඩ නැතිවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වල ආකාරයට ම නියෝජිත ආයතනයට රක්ෂණ මුදල් ගෙවීම සඳහා ද වන පොරොන්දුවක් ;

(ඈ) එම භාණ්ඩ හෝ එම භාණ්ඩවලින් යම් භාණ්ඩයක් මුදල් වලට හැර අන්‍යාකාරයකට නොවිකිණීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඉ) තත් කාලයේ දී ප්‍රවාහනය කරනු නොලැබ හෝ විකුණනු නොලැබ තිබිය හැකි යම් භාණ්ඩයක්, තත් කාර්ය සඳහා ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත නියෝජිත ආයතනය වෙත හෝ නියෝජිත ආයතනයේ නියමය පරිදි භාරදීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඊ) කලින් දැනුම් දීමක් නොමැතිව වරින් වර එම භාණ්ඩ තබා ඇති පරිශ්‍රයට ඇතුළු වී එම පරිශ්‍රය පරීක්ෂා කිරීමට ද එම පරිශ්‍රයේ තිබිය හැකි භාණ්ඩ ගණනය කිරීමට ද නියෝජිත ආයතනයට අවසර දීම සඳහා වූ පොරොන්දුවක් ;

(උ) එම භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී සහ විකිණීමේ දී අයිතිය පිළිබඳ ලේඛන සහ එම භාණ්ඩවලට අදාළ වෙනත් ප්‍රවාහන ලේඛන භාර දෙන ලෙස නියෝජිත ආයතනය ඉල්ලා සිටියහොත් එසේ භාරදීම සඳහා වූ පොරොන්දුවක් ;

(ඌ) එම භාණ්ඩ, නියෝජිත ආයතනයේ නමට නිශ්චිත පරිශ්‍රයක හෝ ගුදමක ගබඩා කිරීම සඳහා වූ පොරොන්දුවක් ; සහ

(එ) දේශීය භාර ලදුපතට අදාළ ප්‍රවාහන ලේඛන, භාණ්ඩ සහ විකිණීමෙන් ලැබෙන මුදල්, එම දේශීය භාර ලදුපත ලියා අත්සන් කළ තැනැත්තාගේ වෙනත් යම් සහ සියලුම ප්‍රවාහන ලේඛන, භාණ්ඩ සහ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් බැහැරව වෙන් වශයෙන් තැබීම සඳහා වූ පොරොන්දුවක්.

(3) එම උපවගන්තියේ දැක්වෙන පොරොන්දුවලට අමතරව, යම් පොරොන්දුවක්, කොන්දේසියක් හෝ නියමයක් එම ලේඛනයෙහි ඇතුළත් කරනු ලැබීම, (2) වන උපවගන්තියේ සඳහන් කිසිවකින් වළක්වනු ලබන බවට සලකනු නොලැබිය යුතු ය.

පනත අදාළ වන භාර ලදුපත්වල නීතියේ බලපෑම.

3. (1) 2 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු විසින් දේශීය භාර ලදුපතක් ලියා අත්සන් කරනු ලැබ, එම ලදුපත අදාළ වන භාණ්ඩවලට ලියා අත්සන් කරනු ලැබ, එම ලදුපත අදාළ වන භාණ්ඩවලට බලපාන විකුණුම් බිල් පත්‍රයක් ලෙස එය ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවක දී එම භාර ලදුපතේ සඳහන් යම් මුදලක් එම ලදුපත යටතේ නියෝජිත ආයතනය වෙත ගෙවීමට ඇති හෝ නොගෙවා ඇති කාල සීමාව තුළ දී පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය :—

(අ) යම් අධිකරණයක යම් තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීමේ දී වෙනත් යම් තැනැත්තකු විසින් භාණ්ඩ තහනමට ගනු ලැබීමේ දී, තහනමට ගැනීම ක්‍රියාත්මක කරනු ලැබුවේ යම් නඩුවක් අතරතුර දී ද එම නඩුවේ දී එම අධිකරණය වෙත නියෝජිත ආයතනය විසින් කරනු ලබන ඉල්ලීමක් මත, ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් නියෝජිත ආයතනය විසින් තෝරාගනු ලැබ අධිකරණය විසින් අනුමත කරනු ලැබූ වෙන්දේසිකරුවකු විසින් හෝ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයට සහ අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි විධාන වලට යටත්ව, භාණ්ඩ විකිණිය යුතු බවට විධාන කරන ආඥාවක් ලබා ගැනීම සඳහා නියෝජිත ආයතනයට හිමිකම් තිබිය යුතු ය. එම භාණ්ඩ විකිණීමේ දී විකිණීමෙන් ලැබුන මුදලින්, දේශීය භාර ලදුපත යටතේ අයවිය යුතු මුදල් තබා ගැනීමට නියෝජිත ආයතනයට හිමිකම් ඇති අතර, විකිණීමෙන් ලැබුන මුදලින් යම් මුදලක් ඉතිරිව ඇත්නම් එම මුදල අධිකරණයට ගෙවනු ලැබිය යුතු ය. තව ද එම මුදල, එම භාණ්ඩ තහනමට ගනු ලැබුවේ යම් තීන්දු ප්‍රකාශයක් යටතේ ද එම තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීමේ දී භාණ්ඩ විකිණීමෙන් ලැබුන මුදල ලෙස සැලකිය යුතු ය.

(ආ) දේශීය භාර ලදුපත ලියා අත්සන් කරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා බුන්වත් භාවයට පත් වුවහොත්, දේශීය භාර ලදුපත අදාළ වන්නේ යම් භාණ්ඩ සඳහා ද එම භාණ්ඩ නියෝජිත ආයතනය වෙත භාර දිය යුතු බවට සහ ඒවා ප්‍රසිද්ධ වෙන්දේසිය මඟින් නියෝජිත ආයතනය විසින් තෝරා ගනු ලැබ අධිකරණය විසින් අනුමත කරනු ලැබූ වෙන්දේසිකරුවකු විසින් හෝ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකි ආකාරයට සහ අධිකරණය විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව විකුණනු ලැබිය යුතු බවට විධාන කරන ආඥාවක් එම බුන්වත් භාවය පිළිබඳ නඩු කටයුතු විභාග වෙමින් පවත්නා අධිකරණයෙන් ලබා ගැනීමට, එම නියෝජිත ආයතනයට හිමිකම් තිබිය යුතු ය. එම භාණ්ඩ විකිණීමේ දී විකිණීමෙන් ලැබෙන මුදල් වලින් දේශීය භාර ලදුපත යටතේ නියෝජිත ආයතනයට අයවිය යුතු මුදල තබා ගැනීමට එම ආයතනයට හිමිකම් තිබිය යුතු අතර, විකිණී

මෙන් ලැබුන මුදලින් ඉතිරි යම් මුදලක් ඇත්නම් එම මුදල, බුන්වත් පුද්ගලයාගේ බූදලයෙන් පැවරුම්කරුගේ බැරට අධිකරණය වෙත ගෙවනු ලැබිය යුතු ය ;

(ඇ) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති යම් පොරොන්දුවකට අනුකූලව නියෝජිත ආයතනය වෙත යම් භාණ්ඩ භාරදෙනු ලැබූ අවස්ථාවක දී, එම භාණ්ඩ ඉවත් කර ගැනීමෙන් පසුව හෝ දේශීය භාර ලදුපත ලියා අත්සන් කළ තැනැත්තා එකඟ වන්නේ නම්, භාණ්ඩ තබා ඇති පරිශ්‍රයේ දී ම හෝ එසේ භාර දෙනු ලැබූ භාණ්ඩ නියෝජිත ආයතනය විසින් විකුණනු ලැබිය හැකි ය. භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් දේශීය භාර ලදුපත යටතේ නියෝජිත ආයතනයට අයවිය යුතු මුදල තබා ගැනීමට එම ආයතනයට හිමිකම් තිබිය යුතු අතර යම් මුදලක් ඉතිරිව ඇත්නම් එම මුදල දේශීය භාර ලදුපත ලියා අත්සන් කළ තැනැත්තාට ගෙවනු ලැබිය යුතු ය ; තව ද

(ඈ) දේශීය භාර ලදුපත ලියා අත්සන් කරන ලද්දේ යම් තැනැත්තකු විසින් ද එම තැනැත්තා යම් කඩකිරීමක් සිදු කරන්නේ නම් හෝ දේශීය භාර ලදුපත අන්තර්ගත පොරොන්දුවක් වන 2 වන වගන්තියේ (2) වන උප වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් පොරොන්දුවකට එකඟව ක්‍රියා කිරීම පැහැර හරින්නේ නම් හෝ ඔහු වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු තුනකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ නියෝජිත ආයතනයට ගෙවීමට ඇති හෝ අය වීමට ඇති මුදල බවට දේශීය භාර ලදුපතේ සඳහන් වන මුදලට අඩු නොවන්නා වූ ද එම මුදලේ තුන් ගුණයට වැඩි නොවන්නා වූ ද මුදලක් දඩ මුදල් වශයෙන් ගෙවීමට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) දේශීය භාර ලදුපතක් යටතේ අයවිය යුතු මුදල, අනුමත ණය නියෝජිත ආයතනයට ගෙවීම හෝ එම ආයතනය විසින් අයකර ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ ඇති විධිවිධාන සැලසීම, එම මුදල අයකර ගැනීමේ කාර්යය සඳහා හෝ එම මුදලින් යම් කොටසක් දැනටමත් ගෙවනු ලැබ ඇති හෝ අයකර ගනු ලැබ ඇති අවස්ථාවක දී අයවීමට ඇති ඉතිරි මුදල අයකර ගැනීමේ කාර්යය සඳහා නියෝජිත ආයතනයට යම් අයිතිවාසිකමක් හෝ ප්‍රතිකර්ම යක් ලැබී ඇත්තේ යම් ලිඛිත නීතියක හෝ වෙනත් නීතියක විධි විධාන යටතේ ද එම විධිවිධානවලට ආදේශ කිරීම හෝ එම විධි විධාන හීන කිරීම සඳහා නොව එම විධිවිධානවලට අමතරව විය යුතු ය.

**පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.**

4. මේ පනත යටතේ වූ වරදක්, පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක දී,—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන්නේ නම්, එම සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම, කළමනාකරුවකුම හෝ ලේකම්වරයකුම ද ;

(ආ) එම පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, එම ව්‍යාපාර ආයතනයේ සෑම කොටස්කරුවකුම ද ; සහ

(ඇ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාපිත නොවන මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සාමාජිකයකු වන සෑම තැනැත්තකුම ද

එම වරදට වරදකරු වන ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද එම වරද සිදු කරන ලද්දේ තමාගේ දැනුමක් නොමැතිව බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමෙහි ලා තමා සියළු නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බවට හෝ එම මණ්ඩලයේ අධ්‍යක්‍ෂවරයකු හෝ නිලධරයකු හෝ එම ව්‍යාපාර ආයතනයේ කොටස්කරුවකු හෝ ඔප්පු කරන්නේ නම් එම තැනැත්තා එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

අනුමත ණය නියෝජිත ආයතන.

5. (1) මේ පනතෙහි "අනුමත ණය නියෝජිත ආයතනය" යන්නෙන්—

(අ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව බලයලත් වාණිජ බැංකුවක් ;

(ආ) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකු පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව ;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව ;

(ඈ) (165 වන අධිකාරය වූ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව ;

(ඉ) 6 වන වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබ ඇත්තේ යම් සමාගමක් හෝ සමූපකාර සමිතියක් හෝ සම්බන්ධයෙන් ද, ඒ සමාගම හෝ සමුපකාර සමිතිය.

(2) (1) වන උපවගන්තියේ (ආ), (ඇ) සහ (ඈ) ඡේදවල සඳහන් යම් ආයතනයක් විසින් දේශීය භාර ලදුපත් ලියා අත්සන් කිරීමේ ප්‍රතිඥාව වශයෙන් ණය දීමේ හෝ ණය පහසුකම් සැලසීමේ බලය, එම ආයතනය පිහිටුවීමේ සහ එම ආයතනය වෙත කාර්ය සහ කර්තව්‍ය පැවරීමේ පනත මගින් එම ආයතනය වෙත පවරනු ලැබ නැත්නම් මේ පනතේ ඇති කිසිවකින් එසේ ණය දීමට හෝ ණය පහසුකම් සැලසීමට එම ආයතනය වෙත බලය පවරන ලෙස සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ බලය පවරන බවට තේරුම් නොගත යුතු ය.

වාණිජ අධ්‍යක්ෂවරයාගේ බලතල.

6. වාණිජ අධ්‍යක්ෂවරයාගේ මතයට අනුව මේ පනතේ කාර්යයන් සඳහා ප්‍රමාණවත් මූල්‍ය ස්ථාවරත්වයක් සහ තත්ත්වයක් ඇති 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් සමාගමකට හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සඳහන් නොකරන ලද කිසියම් සමුපකාර සමිතියකට හෝ මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යයි ප්‍රකාශ කිරීම, ජාතික ආර්ථිකයේ යහපත පිණිස, යෝග්‍ය වන්නේ යයි වාණිජ අධ්‍යක්ෂවරයා අදහස් කරන අවස්ථාවල, ඔහු විසින් එම විධිවිධාන එසේ අදාළ විය යුතු බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

අනනුකූලතාවක් ඇතිවූවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම **දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා** ලබාගත හැකිය.